# සීගිරි සිතුවම් තුළින් හෙළිවන සමකාලීන නිරූපණ ශිල්පය පිළිබඳ අධ්‍යයනයක්

**හේමචන්ද්‍ර පී.ඩී.ඒ.එස්.**[1]

මානවයා ශිෂ්ටාචාරගතවත්ම ඔවුන්ගේ අවශ්‍යතාද ක්‍රමයෙන් වර්ධනය විය. එහි එක් සුවිශේෂී ලක්ෂණයක් වූයේ ඇඳුම් පැළඳුම් භාවිතයට හුරුවීමයි. මුල් යුගයේ ඇඳුම ඇඳීම ශරීරයේ ආරක්ෂාවට පමණක් සීමා වුවත් සිතීමේ ශක්තිය දියුණුවත්ම ඇඳුම් සහ ආභරණ පැළඳීම විලාසිතාවක් හෙවත් නිරූපණ ශිල්පයක් දක්වා වර්ධනය විය. මෙම නිරූපණ ශිල්පයට උදාහරණ සපයන ප්‍රධාන ස්ථානයක් ලෙස සීගිරිය හඳුන්වාදිය හැකිය. සීගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රය ආශ්‍රිතව හමුවන සිතුවම් තුළින් හෙළිවන නිරූපණ ශිල්පීය දැනුම නූතන ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා යොදාගත හැක්කේ කෙසේද? යන්න මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වූ අතර අධ්‍යයන අරමුණ වූයේ සමකාලීන අවධියේ පැවති සමාජ, ආර්ථික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම හා නිරූපණ ශිල්පීය දැනුම සමාජගත කිරීමය. මේ සඳහා දත්ත එක්රැස් කිරීමේදී ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය පාදක කරගන්නා ලදී. සීගිරි සිතුවම් සියල්ලම කාන්තා රූප වන අතර රජ බිසෝවරු සහ සේවිකාවන් නිරූපණය කරයි. සිතුවම් බොහොමයක උඩුකය පමණක් දිස්වන අතර ඇතැම් සිතුවම්හි යටිකය තරමක් දුරට නිරූපණය වේ. එමෙන්ම උඩුකය වැසෙන සේ දුහුල්, ඇඟට ඇලුණු ආකාරයෙන් නිමාකළ අත්කොට කංචුකයක් බෙල්ල ලඟින් සිරවූ සහ පිටුපසට ඇමිණිය හැකි ලෙස නිමා කර ඇත. ඇතැම් සිතුවමක බිසෝවරු මෙන්ම සේවිකාවන්ද පයෝධරයන් වැසෙන සේ චෝලියක් ඇඳ ඇති අතර ඇතැම් ලළනාවන් හැට්ටයට උඩින් තනපටක් බැඳීම දක්නට ලැබේ. ශරීර වර්ණයට සමානත්වයක් දක්වන ඇඳුම මෙන්ම තද පැහැති වර්ණයන්ගෙන් ඇඳුම් නිර්මාණය කර ඇත. මෙම ඇඳුම් විලාසිතාවන් රතු, කොළ හා කහ මිශ්‍රව ඇඳ ඇති අතර තනි පාටින් යුක්තය. ආභරණ පැළඳීමේදී මණිවළලු සහ කුණ්ඩලාභරණ ආදිය පැළඳ තිබෙන අතර සිතුවමට නඟා ඇති ලළනාවන් තාලිපොට, අෂ්ඨිකාමාලය, චෛකක්ෂක මාලය ආදී ආභරණද පැළඳ සිටියි. මීට අමතරව හිස් අලංකාරය සඳහා දිගු කේෂ කලාපය මුහුලක් කර බැඳ කිරීටයකින් සරසා ඇත. මල් සහිත රනින් තැනූ ඔටුන්නක් හැඩයට තැනූ සැරසිල්ලක් බැඳ තිබේ. නොයෙක් ආකාරයෙන් කෙස් කළඹ ඉහළට කර බැඳ වෛවර්ණ පළඳනා භාවිතා කර ඇත. මේ සැරසිලි හිස් වැසුම් ලෙස නොව කේෂාභරණ ලෙස හඳුනාගත හැක. මේ අනුව මෙම ලළනාවන් සාමාන්‍ය කාන්තාවන් නොව සමාජයේ ඉහළ තැනක සිටි කාන්තාවන් බව හඳුනාගත හැක. ඒ අනුව සමකාලීන සමාජය තුළ පැවති නිරූපණ ශිල්පය සීගිරි සිතුවම් තුළින් හඳුනාගත හැකි බව මෙම පර්යේෂණයේ නිගමනය විය.

**මුඛ්‍ය පද** : සීගිරි සිතුවම්, ඇඳුම් පැළඳුම්, ආභරණ, සමකාලීන සමාජය

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ayeshasanjeewani04@gmail.com